**ශ්‍රී ලංකා**
**ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**පාර්ලිමේන්තුව**

---

# 2009 අංක 2 දරන මාදම්පේ තනිවැල්ල මහා දේවාල භාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ජනවාරි මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ජනවාරි මස 30 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 2 දරන මාදම්පේ තනිවැල්ල මහා දේවාල භාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 ජනවාරි මස 30 වන දින]

එල්. ඩී.— ඕ. අයි. එන්. සී. 11/2006.

### මාදම්පේ තනිවැල්ල මහා දේවාල භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

ප්‍රසිද්ධ නොතාරිස් වික්ටර් ප්‍රඥාවංශ කරුණාරත්න විසින් සහතික කරනු ලැබුවා වූ, අංක 67 හා 1997 දෙසැම්බර් මස හතරවන දින දරන භාර ඔප්පුව හා සම්බන්ධ අරමුණු හා කාරණා කාර්යක්ෂම ලෙස කරගෙන යාමේ කාර්යය සඳහා "මාදම්පේ තනිවැල්ල මහා දේවාලය භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන භාරයක් එහි සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව මින් පෙර පිහිටුවනු ලැබ ඇති හෙයින් ද: පූර්විකාව.

තව ද, එකී භාරයේ භාරකරුවන් විසින් එකී භාරය පිහිටුවනු ලැබුවේ යම් අරමුණු සහ කාර්යය සඳහා ද ඒවා කාර්යක්ෂම ලෙස කරගෙන ගොස් ඇති බැවින් ද, එම භාරකරුවන් විසින් එම භාරය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලීමක් කර ඇති හෙයින් හා එකී ඉල්ලීමට ඉඩදීම පොදු යහපතට හේතුවන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2009 අංක 2 දරන මාදම්පේ තනිවැල්ල මහා දේවාල භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) මාදම්පේ තනිවැල්ල මහා දේවාල භාරයේ මේ දක්වා සාමාජිකයන්ව සිටියා වූ ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ මින්මතු සාමාජිකයන් ලෙස ඇතුළත් කරගන්නා වූ සාමාජිකයන් "මාදම්පේ තනිවැල්ල මහා දේවාල භාරය" යන නාමය හා අභිධානය යටතේ සංස්ථාවක් විය යුතු ය. සංස්ථාවට අවිච්ඡින්න පැවැත්මක් තිබිය යුතු අතර, එකී නාමයෙන් සංස්ථාව විසින් නඩු පැවරීම ද, සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද, කළමනාකරණ මණ්ඩලය තීරණය කරනු ලැබිය හැකි පරිදි එය වෙනස් කිරීමට ද, සංස්ථාවට බලය තිබිය යුතු ය. මාදම්පේ තනිවැල්ල මහා දේවාල භාරය සංස්ථාගත කිරීම.

2-PL 003223 -2,650 (2008/09)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාගත කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) මාදම්පේ තනිවැල්ල මහා දේවාලය හා එහි පූජා ස්ථානය කළමනාකරණය කිරීම, පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම;

(ආ) මාදම්පේ තනිවැල්ල මහා දේවාලයට අදාළ සියලු ආගමික වතාවත් පිළිපැදීම සහ ඉෂ්ට කිරීම ;

(ඇ) එකී දේවාලයේ වාර්ෂික දානය පිළිගැන්වීම සංවිධානය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ඈ) බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම හා සංඝ ශාසනය පෝෂණය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලසීම;

(ඉ) සංඝයා වහන්සේලා මගින් බෞද්ධයන්ට බුද්ධ ධර්මය ඉගැන්වීම සහ උන්වහන්සේලාගේ නඩත්තුව සහ සුභසාධන කටයුතු ඉටු කිරීම;

(ඊ) බුද්ධ ධර්මයට අනුව ජීවිතය පවත්වා ගෙනයාම සඳහා බෞද්ධයන් දිරි ගැන්වීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ විධිවිධානවලට සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලැබිය හැකි රීති වලට යටත්ව (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකාර මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී මාදම්පේ තනිවැල්ල මහා දේවාල භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් සිටියා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:—

(අ) යම් මිලදී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පැවරුනු යම් චංචල හෝ නිශ්චල දේපළ අත්පත් කර ගැනීම හෝ දැරීම;

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, ඔවුනට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ සේවයෙන් නෙරපීම;

(ඈ) දේශීය හෝ විදේශීය මූලාශ්‍ර වලින් මුදලින් හෝ වෙනත් ආකාරයකට ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ මුදල් සොයා ගැනීම;

(ඊ) සංස්ථාවට අයත් මුදල්, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි සුරැකුම්පත්වල ආයෝජනය කිරීම.

**6.** (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ගීකරණය කිරීම සහ ගෙවිය යුතු සාමාජික ගාස්තු, සාමාජිකත්වයට ඔවුන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හෝ නෙරපීම;

(ආ) මණ්ඩලයට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ එහි බලතල සහ කාර්යය;

(ඇ) ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ධුර කාලය, ඉල්ලා අස්වීම, ධුරය අත්හැරීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල;

(ඈ) සංස්ථාවේ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්යය සහ කර්තව්‍ය;

(ඉ) මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ සඳහා වූ ගණපූරණය සහ එහි දී කටයුතු පැවැත්වීම; සහ

(ඊ) සංස්ථාවේ අරමුදල් ඇතුළු එහි දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයටම සහ එවැනි රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් මේ වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට, එහිම අරමුදලක් තිබිය යුතු අතර, එය මුදලින් හෝ අන්‍යාකාරයකින් ලැබෙන අරමුදල්, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ ගාස්තුවලින් සමන්විත විය යුතු ය.

(2) ලැබෙන සියලු මුදල් බැංකු එකක හෝ ඊට වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි, සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා යම් සුදුසු ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීමේ දී සංස්ථාවට දැරීමට සිදුවන සියලු වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

8. (1) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තබා ගැනීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන, සුදුසුකම් ලත් විගණකවරයකු මගින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ සුදුසුකම් ලත් විගණකවරයා යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ,

අදහස් වේ.

සංස්ථාවට අයවිය යුතු සහ ගෙවිය යුතු ණය.

**9.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙරාතුවම වූ දිනයේ දී භාරයේ පැවති සියලු ණය සහ වගකීම් සංස්ථාව විසින් ගෙවිය යුතු ය. එදිනට භාරයට අයවිය යුතුව තිබූ ණය, සම්මාදම් සහ දායක මුදල්, මේ පනතේ අරමුණු සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**10.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම්, පියවීමෙන් පසු කවරාකාරයක හෝ යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** සංස්ථාවේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් තැනැත්තකු හෝ තැනැත්තන් භාරයේ තිබිය යුතු අතර, එය සංස්ථාවේ රීති මගින් විධිවිධාන සලසා ඇති පරිදි වූ ධුර දරන්නන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස, කිසිම සාධන පත්‍රයකට තබනු

නොලැබිය යුතු අතර, එම ධුර දරන්නන් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

13. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.